# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,086 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 530 |

*සැ. යු.* - ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 සැප්තැම්බර් මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

529-B 081442— 353 (2018/08)
D 1 -

# විවිධ දැන්වීම්

## (සිය සිවිල්/වාණිජ අධිකරණ බලය ක්‍රියාවට නංවමින්) කොළඹ පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

නොතීසිය

2007 අංක 07 දරන සමාගම් පනතේ 529 වගන්තිය සමග කියවනු ලබන 270 සහ 272 වගන්ති යටතේ ගණන් බේරා වසා දැමීම සඳහා කරන ලද ඉල්ලීමක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

සී/ස ග්‍රෝ සොයිල් සබ්ස්ට්‍රේට්ස් (පුද්ගලික) සමාගම,
අංක 111/2, හෙන්දල පාර,
වත්තල.

නඩු අංකය : HC/CIVIL/41/2018/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
වටිනාකම : රු. 2,085,620.00
ඇ. ඩො. 13,031.06
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ ඒ ප්‍රකාරව ගරු අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා කරන ලද ඉල්ලීමක් පිළබඳ කාරණය සම්බන්ධයෙනි.

සී/ස පොලී ක්‍රියේෂන්ස් සබ්ස්ට්‍රේට්ස් (පුද්ගලික) සමාගම,
අංක 848/5, මීගමුව පාර,
මාබෝල, වත්තල.

..................................*පෙත්සම්කරු.*

ඉහත ගණන් බේරා වසා දැමීමට යෝජිත සමාගම, ගණන් බේරා වසා දැමීම සඳහා වර්ෂ 2018 ක් වූ ජුනි මස 06 වැනි දින ඉහත නම් සඳහන් පෙත්සම්කරු වන සී/ස පොලී ක්‍රියේෂන්ස් සබ්ස්ට්‍රේට්ස් (පුද්ගලික) සමාගම විසින් (සිය සිවිල්/ වාණිජ අධිකරණ බලය ක්‍රියාවට නංවමින්) කොළඹ පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලද අතර, එකී පෙත්සම ගරු අධිකරණය ඉදිරියේ විමසීම සඳහා වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දිනට නියම කරන ලද බව මෙයින් නොතිසි දෙනු ලැබේ. එකී පෙත්සම සම්බන්ධයෙන් ගරු අධිකරණය විසින් නියෝගයක් ලබාදීම සම්බන්ධයෙන් පක්ෂ වීමට හෝ එරෙහි වීමට බලාපොරොත්තු වන එම ගණන් බේරා වසා දැමීමට යෝජිත සමාගමේ කවර හෝ ණයකරුවකුට හෝ දායකයෙකුට එකී පෙත්සම විමසීම සඳහා ගනු ලබන වේලාව තුළ තමා විසින්ම හෝ ඔහුගේ/ඇයගේ නීතිඥ හෝ ලේඛනගත නීතිඥ මගින් පෙනී සිටිය හැකි අතර, එම ගණන් බේරා වසා දැමීමට යෝජිත සමාගමේ කවර හෝ ණයකරුවකුට හෝ දායකයෙකුට පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන්නේ නම් මෙහි පහත අත්සන් කරන ලද අය විසින් නියමිත ගාස්තුවලට යටත්ව එකී පිටපත් ලබා දෙනු ලැබේ.

අත්සන් කළේ.- ශාන්‍යා වික්‍රමරත්න,
නීතිඥ,
අංක 61, ඩී. එස්. ෆොන්සේකා පාර,
කොළඹ 05.

දුරකථන අංකය : 077 2265649

***සටහන*** : පෙත්සම විමසීම සඳහා ගනු ලබන දිනයේ දී ගරු අධිකරණයේ පෙනී සිටීමට අපේක්ෂා කරන අයෙකු වේ නම් ඉහත නම් සඳහන් නීතිඥ තැන වන ශාන්‍යා වික්‍රමරත්න මහත්මිය වෙත එලෙස සිදු කිරීමට ඔහුට/ඇයට ඇති චේතනාව පිළිබඳ දන්වමින් නොතීසියක් ලිඛිතව ලබා දිය යුතු හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. එකී නොතීසියේ එම එවනු ලබන තැනැත්තාගේ නම සහ ලිපිනය ද, එය ආයතනයක් වේ නම් එකී ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු වන අතර, එකී තැනැත්තා විසින් හෝ සමාගම විසින් හෝ (එසේ ඇත්තේ නම්) ඔහුගේ හෝ එම ආයතනයේ ලේඛනගත නීතිඥ විසින් එම නොතීසිය අත්සන් කර අනිවාර්යයෙන් වර්ෂ 2018 සැප්තැම්බර් මස 25 වැනි දින ප.ව. 6.00ට පෙර ඉහත නම් සඳහන් නීතිඥ වෙත ලබා දීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් යවන්නේ නම් එකී නියමිත වේලාවට ප්‍රථම එකී නම් සඳහන් නීතිඥ වෙත එකී නොතීසිය ලැබීමට ප්‍රමාණවත් කාලයක් ඇතිව යැවීමට කටයුතු කළ යුතු ය.

අත්සන් කළේ.- ශාන්‍යා වික්‍රමරත්න,
නීතිඥ,
අංක 61, ඩී. එස්. ෆොන්සේකා පාර,
කොළම 05.

දුරකථන අංකය : 077 2265649

08-825

**කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය යටතේ ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් පළාත්බද මහාධිකරණයේ දී ය**

පෙත්සම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති අංක 270(a) සහ/හෝ 270(e), 270 (f) සමග කියවෙන අංක 534 වගන්තියේ දැක්වෙන පරිදි පීක් ක්ලෝතින් ප්‍රයිවට් ලිමිටඩ් අධිකරණය මගින් ඈවරණය කිරීම පිළිබඳව කාරණයේ දී ය.

නඩු අංකය : 28/2018/CO

පීක් ක්ලෝතින් ප්‍රයිවට් ලිමිටඩ්,
මෙල්ෆට් එස්ටේට්,
ගැමුණුපුර,
කොතලාවල,
කඩුවෙල.

.................................*පෙත්සම්කරු.*

කොළඹ පිහිටි සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බද මහාධිකරණය වෙත ඉහත නම් සඳහන් සමාගම විසින් 2018 මාර්තු මස 29 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත් එකී පෙත්සම 2018.09.10 වැනි දින අධිකරණය ඉදිරියේ අඬ ගැසිය යුතු බවට නියම කරන බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අඬ ගසන අවස්ථාවේ දී පුද්ගලිකව නීතිඥවරයෙකු හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බවත් මෙයින් දක්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටි ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත සඳහන් අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

*අත්සන් තබන ලදී.*

ශ්‍රීමාල් වීරක්කොඩි,
පෙත්සම්කාර සමාගමේ ලේඛනගත නීතිඥ,
අංක 494/2බී, එම්. ටී. පෙරේරා මාවත,
අංගොඩ.

ඉහත පෙත්සම අඬ ගැසීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ වෙත ලිඛිතව පැමිණ හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීමට අවශ්‍ය වන අතර එම පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ පුද්ගලයා හෝ ආයතනයේ සිය නීතිඥවරු ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීමට හා 2018.09.08 වැනි දින පස්වරු 01.00ට පෙර ඉහත නම් සඳහන් නීතිඥවරයාට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර දීමට හෝ තැපැල් කිරීමට අවශ්‍ය වේ.

පෙත්සම්කාර සමාගමේ ලේඛනගත නීතිඥ තැන.

08-897

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.